# කුලි/ කටුවත්තේවෙල ප්‍රාථමික විද්‍යාලය
## වැවගම

කප්‍රාවි

සංඛ්‍යාංක අංකය 17515

දිනය 2021 / 03 / 23

---

විදුහල්පති
කුලි/ කටුවත්තේවෙල ප්‍රාථමික විද්‍යාලය
වැවගම

ළමා මිතුරු **NOKAI**
ටෝකියෝ
ජපානය

ඔතෙන්සිට්ස් පුද්ගලික සමාගම
කොළඹ

මැතිතුමණි

<u>ගෞරවනීය ස්තුතිය පුද කිරීමයි</u>

කුලි/ කටුවත්තේවෙල ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති වශයෙන් හදපිරි භක්ත්‍යාදර පූර්ව කෘතඥදිත්වය පුද කරනු වස් මෙම ලිපිය ලියමි.

කටුවත්වෙල ප්‍රාථමික පාසල කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ පිහිටි අවම පහසුකම් යටතේ කටයුතු සිදු කරන පාසලකි. වසර 50ක අතීතයක් තිබුණද පාසලේ බොහෝ අඩුපාඩුකම් ඇත. ඒ අතුරෙන් ප්‍රධාන ගැටලුවක්ව පැවති ප්‍රධාන ශාලාව වටා වූ වටපිල නොමැති වීම පංති කාමර වල පොළව කඩතොලු වීම පහ පංතියේ වෙන් කල බිත්තියේ කපරාරුව නොමැතිවීම මේ වන, ඔබ සංවිධානයේ කාරුණික මැදිහත්වීමෙන් නිරාකරණය කොට ඇත.

දරුවෝ ස්වකීය විවේකයේ දී වටපිල මත වාඩිවී පොත් කියවති . ආහාර ගනිති. කඩතොලු රහිත පංති කාමරයේ ඩෙස්ක් පුටු සමබරව තැබීමට එහා මෙහා නොඇදිති එය දකින වාරයක් පසා ඔබතුමන්ගේ අනගි මෙහෙවර සිහිපත් වේ. දෙමාපියෝ ද බොහෝ සතුටෙන් ඔබගේ මෙහෙවර අගය කරති. ඇතැම් දෙමාපියන් නෙතග ඉනි කඳුළෙන් මේ දර්ශනය නරඹති.

ඔබ සංවිධානය අප පාසල වෙත පිරිනමන ලද මෙම ඓසනහස අනාගතයේ දී ඔවුන් රට වෙනුවෙන් දයාද කරන බව අපගේ විශ්වාසයයි. ඉදින් සමස්ත පාසල් ප්‍රජාව වෙනුවෙන් පාසලේ විදුහල්පතිවරයා ලෙස ශිර්ෂාවරෝහණය කොට අපගේ ස්තුතිය ඔබ සංවිධානය වෙත පිරි නමමි.

විදුහල්පති

සංජීව විතානගේ
විදුහල්පති
(ශ්‍රී.ල.වි.සේ. III)
කුලි/කටුවත්තේවෙල ප්‍රාථමික විද්‍යාල
වැවගම